# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

ජාතික ප්‍රමිති ආයතනයක් වශයෙන් ක්‍රියාකරනු පිණිස සහ ඊට අදාළ කරුණු ඉටුකිරීම පිණිස 1964 දී පාර්ලිමේන්තු පනතක් මගින් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය (Bureau of Ceylon Standards) පිහිටුවාලීය.

ජාතික ප්‍රමිති ආයතනයේ කටයුතු ආරම්භ කිරීම, ප්‍රථම මහා මණ්ඩලයෙහි සාමාජිකයින් වූයේ බී ඩී රම්පාල මහතාත් (සභාපති), ආර් ජී ද එස් වෙත්තමුණි මහතාත් (අධ්‍යක්ෂ), එහි ලේකම් වශයෙන් ක්‍රියා කළ කාර්යාංශ කාර්ය මණ්ඩලයේ ප්‍රථම හා එකම සාමාජිකයා වූ හරිශ්චන්ද්‍ර විජයතුංග මහතාත්ය. එවකට ගරු කර්මාන්ත ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් ප්‍රථම මහා මණ්ඩල රැස්වීම කර්මාන්ත අමාත්‍යාංශයේදී පැවැත්විණ. මෙකළ ලංකා තුනී ලැලි සංස්ථා භූමියෙහි පවත්වාගෙන ගිය කාර්යාලය මගින් කාර්යාංශයෙහි වැඩ කටයුතු ගෙන යන ලදී.

විදුලි ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව, සිවිල් ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය හා රසායනික ද්‍රව්‍ය සහ මෙට්‍රිකායනය පිළිබඳ ආංශික කමිටු පත් කිරීම.

එවකට පැවැති කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය වෙතින් ලබාගන්නා ලද ඉන්දියානු හා වෙනත් විවිධ ප්‍රමිතිවල මූලික එකතුවකින් වජිර පාරේ පිහිටි කාර්යාංශ භූමියෙහි පුස්තකාලය පිහිටුවීම. පුස්තකාලයෙහි මූලික කාර්යභාරය වූයේ ප්‍රමිති සකස් කිරීම සඳහා අනුබල දෙන සේවාවක් සැපයීමයි.

බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය වෙතින් ප්‍රදානය කරන ලද බ්‍රිතාන්‍ය ප්‍රමිතිවල පූර්ණ කට්ටලය, පැවති ප්‍රමිති එකතුවට අතිරේකව සැපයිණ.

ප්‍රාථමික කෝෂ නැමැති ප්‍රථම ලංකා ප්‍රමිතිය A 5 ප්‍රමාණයෙන් මුද්‍රණය කොට ප්‍රසිද්ධියට පත් කිරීම. ප්‍රමිති ප්‍රකාශනයෙහි කවරය සඳහා තෝරාගන්නා ලද පාට අළු පාට විය.

ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය අන්තර්ජාතික ප්‍රමිති සංවිධානයෙහි සාමාජිකයෙක් වශයෙන් ඇතුලත් කර ගන්නා ලදී.

අනෙකුත් ජාතික ප්‍රමිති ආයතන වෙතින් ලබාගන්නා ලද ජාතික ප්‍රමිති භාවිතය සඳහා එක්රැස් කොට තබන ලදී.

ආයතනයෙහි කාර්යයන්හි විෂය පථය හා බලතල පුළුල් කිරීම පිණිස පනවන ලද 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මගින් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ලෙස ප්‍රකාශයට පත් කෙරිණි.